ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
අධ්‍යාපනවේදී (විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ)ගෞරව උපාධි වැඩසටහන 2020/2021
5 වන මට්ටම
අවසාන පරීක්ෂණය - 2021
විෂයමාලා න්‍යාය හා පරිචය SNU5244/ESU3144
කාලය පැය තුනයි. (03)

දිනය - 2021.08.14 වේලාව -ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. විෂයමාලාව සහ විෂය නිර්දේශය අතර වෙනස පැහැදිලි කරන්න.

02. සිරස් සහ තිරස් විෂයමාලා සමෝධානය වෙන්කොට දක්වන්න.

03. විෂයමාලා අධ්‍යයනය ගුරුවරුන්ට වැදගත් බව පෙන්වීමට හේතු හතරක් (04) දක්වන්න.

04. විෂයමාලා සංවර්ධන මූලධර්මවල වැදගත්කම කෙටියෙන් සාකච්ඡා කරන්න.

05. 1932 'හන්දෙස්ස අධ්‍යාපන ක්‍රමය' හඳුන්වාදීමේ අරමුණු මොනවා ද?

06. විෂයමාලා ඇගයීම් කරුවකු තුළ තිබිය යුතු ගුණාංග පහක් (05) දක්වන්න.

07. පාසල් විෂයමාලාවක් ක්‍රියාත්මක කිරීමේ දී ගුරුවරයාගේ භූමිකා දෙකක් (02) කෙටියෙන් සාකච්ඡා කරන්න.

08. ඉගෙනුම් අත්දැකීමක දක්නට ඇති ලක්ෂණ පහක් (05) ලැයිස්තු ගත කරන්න.

(ලකුණු 5 X 8 = 40)

## 2 වන කොටස

09\. (i) 'විෂයමාලාව' යන පදය සඳහා පිළිගත් නිර්වචන දෙකක් (02) දක්වන්න. (ලකුණු 08)

(ii) එම නිර්වචන ඇසුරින් විෂයමාලාවෙහි අඩංගු විය යුතු අංග හතර (04) ක් හඳුනා ගන්න. (ලකුණු 06)

(iii) ඉහත දක්වන ලද අංග සැළකිල්ලට ගනිමින් "විෂයමාලාව" යන පදය සඳහා ඔබගේ නිර්වචනයක් සකසන්න. (ලකුණු 06)

10\. (i) විෂයමාලා පරමාර්ථ සහ අරමුණු තීරණය කෙරෙන නිර්ණායක දක්වා නිදසුන් ඇසුරින් පැහැදිළි කරන්න. (ලකුණු 10)

(ii) පරමාර්ථ සහ අරමුණු, සුවිශේෂ අරමුණු සහ සුවිශේෂ චර්යාමය අරමුණු අතර සම්බන්ධතාව නිදසුන් ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 10)

11\. (i) ටයිලර් ගේ විෂයමාලා ආකෘතිය පැහැදිලි කරන්න. (ලකුණු 07)

(ii) ටයිලර් ගේ විෂයමාලා ආකෘතියේ දුබලතා හඳුනාගන්න. (ලකුණු 03)

(iii) එම දුබලතා වීලර්ගේ විෂයමාලා ආකෘතියෙන් මගහරවා ඇත්තේ කෙසේදැයි පරීක්ෂා කරන්න. (ලකුණු 10)

12\. (i) විෂය සමගාමී ක්‍රියාකාරකම් යනු මොනවාදැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) සිසුන්ගේ පෞරුෂ සංවර්ධනය සඳහා විෂය සමගාමී ක්‍රියාකාරකම්වල වැදගත්කම අගයන්න. (ලකුණු 08)

(iii) සිසුන් පාසල තුළ දී විෂය සමගාමී ක්‍රියාකාරකම්වලට සහභාගීවීම දිරිගැන්වීම කළ හැක්කේ කෙසේදැයි පැහැදිළි කරන්න. (ලකුණු 08)

13. (i) විෂයමාලා කළමනාකරණය සහ විෂයමාලා ඇගයීම අතර වෙනස දක්වන්න. (ලකුණු 04)

(ii) විෂයමාලා කළමනාකරණයේ දී විදුහල්පතිවරයාගේ භූමිකාව පරීක්ෂා කරන්න. (ලකුණු 08)

(iii) නිදසුන් දෙකක් (02) වත් දක්වමින්, පාසල් පාදක කළමනාකරණයේ වැදගත්කම අගයන්න. (ලකුණු 08)

14. (i) පාසල් විෂයමාලාව සංවිධානය කිරීමේදී බහුලව යොදා ගනු ලබන ප්‍රවේශ හතර (04) නම් කරන්න. (ලකුණු 04)

(ii) ඉහත එක් ප්‍රවේශයක ස්වභාවය, කැපී පෙනෙන ලක්ෂණ, වැදගත්කම සහ දුර්වලතා සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(iii) ශ්‍රී ලංකාවේ පාසල් විෂයමාලාව සංවිධානයේදී භාවිතයට ගෙන ඇති විෂයමාලා සංවිධාන ප්‍රවේශ පරීක්ෂා කරන්න. (ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.